* සියළු ම හිමිකම් ඇවිරිණි
* *All Rights Reserved*

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 11 | විෂයය Subject: කතෝලික ධර්මය | කාලය Time: පැය 02 |

* **වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

(1) ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ අපෝස්තුළුවරු සුබ අස්න දේශනා කිරීමට පටන් ගන්නේ,
1. ජෙරුසලම හා සමාරියෙනි.
2. ජෙරුසලම හා ජුදයාවෙනි.
3. ගලීලය හා නාසරයෙනි.
4. අන්තියෝකය හා සිරියාවෙනි

(2) හුදෙක් නුඹේම නුවණෙහි නොපිහිටා, මුළු සිතින්..........” මෙම වගන්තිය සම්පූර්ණ කරන්න.
1. දෙවි උතුමන් නමදින්න
2. දෙවිඳුන් අණ පිළිපදින්න
3. හිමිතුම කෙරෙහි විශ්වාසය තබන්න
4. දෙවිඳුන්ට ප්‍රශංසා කරන්න

(3) ජේසුස් වහන්සේගේ මෘත ශරීරය කුරුසියෙන් බා, භූමදාන කටයුතු සිදු කිරීමට ඉදිරිපත් වන්නේ,
1. සිරේනියේ සීමොන්
2. මග්දලාහි මරියා
3. අරමාතියේ ජෝසප්
4. ගමාලියෙල්

(4) පහත හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,




1. මුල් කිතුනු සභාවේ ලක්ෂණ ය.
2. ශු.සභාවේ ලක්ෂණ ය.
3. දේව රාජ්‍යයේ ලක්ෂණ ය.
4. කතෝලික සභාවේ ලක්ෂණ ය.

(5) පහත සඳහන් වරණ අතරින් පාවුළුතුමා හා සම්බන්ධිත කරුණු අඩංගු පිළිතුරු කාණ්ඩය වන්නේ,

A. අන්‍ය ජාතීන්ගේ අපෝස්තුලුවරයා
B. පේදුරු තුමාගේ භාෂා පරිවර්තක
C. නීරෝ අධිරාජ්‍යවරයාගේ සමයේ ප්‍රාණපරිත්‍යාගී විය.
D. ‘‘පර්වතය’’ යන්න නමෙහි අර්ථයයි.

1. A හා B
2. C හා D
3. A හා C
4. B හා D

(6) ශු.පාවුළු තුමා රෝමයේ නිවාස අඩස්සියේ සිටි කාලයේ සිදු කළේ,
1. සුබ අස්න නොඅසා සිටි ජනතාවට ධර්මය දේශනා කිරීම.
2. වැරදි මාර්ගයේ යන්නන්ව නිවැරදි මාර්ගයට යොමු කිරීම
3. සුබ අස්න අසන්නට පැමිණි අය බෞතිස්ම කිරීම
4. රෝම අධිරාජ්‍යයට එරෙහිව චෝදනා කිරීම

(7) ජුසේවාස් පියතුමා අයත් නිකාය වන්නේ,
1. ෆ්‍රැන්සිස්කාන නිකාය
2. දොමිනිකාන නිකාය
3. ජේසු නිකාය
4. ඔරතෝරියානු නිකාය

(8) තමාට තම ගැලවීම ලබාගත හැකි බව සිතීම
1. ඉච්ඡා භංගත්වයයි.
2. දේව විශ්වාසයයි.
3. දේව ධර්ම ගුණයයි.
4. අනුමානයයි.




(9) ඉහත රූප සටහනේ හිස් කොටුවට උචිත මාතෘකාව වන්නේ,

1. කතෝලික සභාවේ ප්‍රධාන අරමුණු
2. ශු.සභාවේ ප්‍රධාන අරමුණු
3. දිව්‍ය පූජා යාගය සිදුකිරීමේ ප්‍රධාන අරමුණු
4. දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ ප්‍රධාන අරමුණු

(10) ‘‘මරණයට පත්වුණත් මම මගේ දේව ජීවිතය නැතිකර නොගනිමි.’’ කියා ජේසුස් වහන්සේට දුන් පොරොන්දුව ඉටුකළ ශුද්ධවන්තිය වන්නේ,

1. ශු.තෙරේසා මව්තුමියයි.
2. ශු.ඇග්නස්තුමියයි.
3. ශු.මරියා ගොරෙන්ති තුමියයි
4. ශු.සිසිලියා තුමියයි.

(11) පුරාණ ගිවිසුමේ වන්දනාවේ කේන්ද්‍රිය ක්‍රියාව වන්නේ,

1. චර්මඡේදනයයි.
2. දසයෙන් කොටස දීමයි.
3. යාග පූජා පුද කිරීමයි.
4. දේව වාක්‍යය සිනගෝගයේ විග්‍රහ කිරීමයි.

(12) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සළකුණක් වන්නේ,

1. මෙල්කිසදෙක්ගේ යාගයයි.
2. කල්වාරි යාගයයි.
3. ඊසාක්ගේ යාගයයි
4. එළියා දිවැසිවරයාගේ යාගයයි

(13) නව ගිවිසුමේ ප්‍රධාන පූජකයා වන්නේ,

1. මෙල්කිසදෙක් ය.
2. කයිපාස් ය.
3. ජේසුස් වහන්සේ ය.
4. සෙකරියස් ය.

(14) ජාතීන්ගේ විනිශ්චය දිනයේ දී ක්‍රිස්තුන් වහන්සේ යොදා ගන්නා මිනුම් දණ්ඩ වනුයේ,
1. යාච්ඤාවේ ජීවිතය හා ශුද්ධවන්තකම
2. ශාරීරික හා ආත්මික පුන්‍ය ක්‍රියා
3. ආත්මික අභ්‍යාස හා උපවාසය
4. ප්‍රසාද ස්නාපනය හා සාංඝිකත්වය

(15) ''බලාපොරාත්තුවේ එළිපත්ත'' යන පොත රචනා කරන ලද්දේ,
1. අති උතුම් 16 වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ය.
2. අති උතුම් 6 වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
3. 23 වන ජුවම් ශුද්ධෝත්තම පියතුමා ය.
4. දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.

(16) ජන වන්දනාවේ ප්‍රධානතම අංගය ලෙස සැලකෙන්නේ,
1. යාච්ඤාව ය.
2. දිව්‍ය පූජාවය
3. දේව වචනය ය
4. පච්කමා කිරීමය

(17) වැඩිහිටි ප්‍රසාද ස්නාපනය ලැබීමට අපේක්ෂාවෙන් සිටින්නන්ව සූදානම් කරන අවසාන කාලය වනුයේ,
1. නත්තල් සමය
2. සාමාන්‍ය සමය
3. පාස්කු සමය
4. චතාරික සමය

(18) දිව්‍ය පූජාවේ ආරම්භක පිළිවෙතේ පළමුවන හා අවසාන අනු කොටස් දෙක වනුයේ,
1. ඇතුළුවීමේ ගීතිකාව / පොදු යැදුම
2. හැඳින්වීම / පොදු යැදුම
3. ආචාරය / පොදු යැදුම
4. පශ්චාත්තාපික පිළිවෙත / පොදු යැදුම

(19) සන්තියාගෝ මුනිතුමාගේ හිස ගසා මරා දමනු ලැබුවේ,
1. මහා හෙරෝද්
2. හෙරෝද් ඇන්ටිපස්
3. හෙරෝද් (අග්‍රිපා)
4. පිලාත්

(20) ක්‍රිස්තුන් වහන්සේ තමන් දේව පුත්‍රයාණන් බව ප්‍රකාශ කළ අවස්ථාවක් වන්නේ,
1. ස්වාමිවාක් ආරාධනාවයි.
2. කන්ද උඩ දේශනාවයි.
3. උත්තම පූජක යැදුමයි.

4. මල් උයනේ යැදුමයි.

(21) මුලසුනේ පළමු යැදුම ( පොදු යැදුම) වැදගත් වන්නේ,

1. එමඟින් දෙවිඳුන්ට තුති පුදන නිසාය.
2. ජනතාවගේ සියලු යැදුම්, අදහස් එකතු කරන නිසාය.
3. එය ඉතා පැහැදිලිව හා කෙටියෙන් ඉදිරිපත් කරන නිසාය.
4. පියතුමා විසින් එම යැදුම දෙවියන් වහන්සේට පුද කරන නිසා ය.

(22) ''මෙතනට ළං නොවන්න.... නුඹ සිටින ස්ථානය ශුද්ධ භූමියකි.'' යනුවෙන් දෙවියන් වහන්සේ ප්‍රකාශ කළේ,

1. ආබ්‍රහම් තුමාට ය.
2. මෝසෙස් තුමාටය.
3. ඊසාක් තුමාටය.
4. ජාකොබ් තුමාටය.

(23) පංච පුස්තකය සකස් වී ඇත්තේ,

1. පරම්පරාගත විශ්වසය හා අත්දැකීම් පදනම් කරගෙන ය.
2. එදිනෙදා ජීවිත සිද්ධීන් පදනම් කරගෙන ය.
3. ඊශ්‍රායෙල් ජනතාවගේ කතාන්දර පදනම් කරගෙන ය.
4. ඊශ්‍රායෙල් දිවැසිවරුන්ගේ අත්දැකීම් පදනම් කරගෙන ය.

| ශුභාරංචිය | .................... | .................. | .................. | .................. |
|---|---|---|---|---|
| ලියවුණු කාලය | ක්‍රි.ව. 80 – 90 | ක්‍රි.ව. 80- 85 | ක්‍රි.ව. 64 - 66 | ක්‍රි.ව. 90 - 100 |
| ස්ථානය | සිරියා පලස්තීන | සිරියා අන්තියෝකිය | රෝමය | එපීසය |

(24) ඉහත වගුවේ හිස්තැනට සුදුසු පිළිතුරු අනුපිළිවෙල වන්නේ,

1. මතෙව් ශුභාරංචිය /ලූක් ශුභාරංචිය / මාක් ශුභාරංචිය / ජොහාන් ශුභාරංචිය
2. ලූක් ශුභාරංචිය / මතෙව් ශුභාරංචිය / ජොහාන් ශුභරංචිය / මාක් ශුභාරංචිය
3. මාක් ශුභාරංචිය / මතෙව් ශුභාරංචිය / ලූක් ශුභාරංචිය / ජොහාන් ශුභාරංචිය
4. ජොහාන් ශුභාරංචිය / මාක් ශුභාරංචිය / ලූක් ශුභාරංචිය / මතෙව් ශුභාරංචිය

(25) ශුභාරංචියක් ලියන ලද එකම අන්‍ය ජාතිකයා වන්නේ,

1. ශු.ලූක් තුමා
2. ශු.ජොහාන් තුමා
3. ශු.මාක් තුමා
4. ශු.මතෙව් තුමා ය.

(26) යාච්ඥාවෙන් දෙවියන් අත්දැකීමට අපට ආරාධනා කරන ශුභාරංචිය වන්නේ,

1. ලූක් තුමාගේ ශුභාරංචිය
2. මාක් තුමාගේ ශුභාරංචිය

3. මතෙව් තුමාගේ ශුභාංරචිය
4. ජොහාන් තුමාගේ ශුභාරංචිය

(27) ලේඛක දිවැසිවරු කාණ්ඩය වන්නේ,
1. යෙසායා ,ජෝනා, එලීෂා
2. හුල්දා , එලියා , ජෙරමියා
3. ජොවෙල්, ආමොස් , එසකියෙල්
4. හග්ගයි , මලාකි , අභියා

(28) සරල සාහිත්‍යමය භාෂා ශෛලියක් යොදාගෙන ඇති සම්ප්‍රදාය වන්නේ,
1. එලොහිම් සම්ප්‍රදාය
2. ද්විතීය නීති සම්ප්‍රදාය
3. පූජක සම්ප්‍රදාය
4. යාවේ සම්ප්‍රදාය

(29) ''ප්‍රොෆේටේස්'' යන ග්‍රීක වචනයේ අර්ථය වන්නේ,
1. කෙනෙකු වෙනුවෙන් පෙනී සිටින්නා
2. කෙනෙකු වෙනුවෙන් කතා කරන්නා
3. කෙනෙකු වෙනුවෙන් පූජා කරන්නා
4. කෙනෙකු වෙනුවෙන් වැය වන්නා

(30) දිමිත්‍රියස් ලෙස හඳුන්වනු ලබන්නේ,
1. පළමු වන ටොලමි රජතුමා
2. දෙවන හෙරෝද් රජතුමා
3. පළමුවන සලමොන් රජතුමා
4. දෙවන ටොලමි රජතුමා

(31) ''නබී'' යන හේබ්‍රව් වචනයේ අර්ථය වන්නේ,
1. ක්‍රිස්තුන් වහන්සේ ය.
2. දෙවියන් වහන්සේ ය.
3. උපස්ථායකයන් ය.
4. දිවැසිවරුන් ය.

(32) දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමඟ ඇතිකර ගත් ගිවිසුම ඉදිරිපත් කර ඇති සම්ප්‍රදායන් දෙක වන්නේ,
1. යාවේ සම්ප්‍රදාය සහ එලෝහිම් සම්ප්‍රදාය
2. ද්විතීය නීති සම්ප්‍රදාය සහ පූජක සම්ප්‍රදාය
3. යාවේ සම්ප්‍රදාය සහ පූජක සම්ප්‍රදාය
4. යාවේ සම්ප්‍රදාය හා ද්විතීය නීති සම්ප්‍රදාය

(33) ස්නාවක ජොහාන් තුමාග් දේශනය් අරමුණ වූයේ , ජනතාව,
1. සිත්හැරීමකට යොමු කිරීමයි.
2. පොදු සේවාවන් සඳහා යොමු කිරීමයි.

3. යුක්තිගරුක පුද්ගලයන් කිරීමයි.
4. කිතු දහම ආරම්භ කිරීමයි.

(34) ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ වූයේ,
1. ස්නාවක ජොහාන්තුමාගේ බෞතිස්මය ලැබීමෙනි.
2. සබත් දින ධර්ම ශාලාවේ දේශනයෙනි.
3. පරීක්ෂාවන්ට මුහුණ දීමෙනි.
4. කනා නුවර දී වතුර මිදි යුෂට හැරවීමෙනි.

(35) ''එම්බා පොළොං වංශය එන්නට තිබෙන උදහසින් පලා යන්න නුඹලාට අවවාද කළේ කවරෙක් ද ?'' මෙලෙස ස්නාවක ජුවාම් තුමා චෝදනා කළේ ,
1. පරිසිවරුන්ටය.
2. ප්‍රභූවරුන්ට ය.
3. ජුදා ජාතිකයන්ට ය.
4. හේවායන්ට ය.

(36) දෙවියන් වහන්සේ හා නෝවා අතර ඇති කරගත් ගිවිසුමේ බාහිර සලකුණ වන්නේ,
1. චර්මච්ඡේදනය
2. දේදුන්න
3. ඝන වලාකුළ
4. තද වර්ෂාව

(37) ''ක්‍රියා විරහිත ඇදහිල්ල මළ ඇදහිල්ලකි.'' මෙසේ සඳහන් වන්නේ,
1. ගලාති ලිපියේ ය.
2. පිලිප්පි ලිපියේ ය.
3. ජාකොබ් ලිපියේ ය.
4. රෝම ලිපියේ ය.

(38) ලේඛක දිවැසිවරුන් ප්‍රධාන හා සුළු දිවැසිවරුන් ලෙස වර්ගීකරණයේ පදනම වන්නේ,
1. දිවැසිවරයාගේ ස්වරූපය අනුව ය.
2. දිවැසිවර ග්‍රන්ථයේ විශාලත්වය අනුව ය.
3. ධර්මදූත කාර්යයේ ස්වභාවය අනුව ය.
4. දූත මෙහෙවර සනාථ කිරීමේ දී කළ හාස්කම් අනුව ය.

(39) උත්පත්ති පොතේ දෙවන මැවීමේ කථාවේ දැකිය හැකි සුවිශේෂී දෙයක් වන්නේ,
1. සබත් දිනය පිළිබඳව දැක්වීම.
2. අණ කිරීම තුළ සියල්ල ඉටුවීම
3. දින හතක කාලයක් තුළ සියල්ල මැවීම
4. ස්ත්‍රිය පුරුෂයගේ ඉල ඇටයෙන් මැවීම.

(40) දෙවියන් වහන්සේ හා ආදි මවුපියන් අතර ගිවිසුමට පාදක වූයේ,
1. අහිමි වූ දේව සබඳතාව යළි ඇති කිරීමයි.
2. කළ වරදට ආදි මව්පියන්ට දඬුවම් දීමයි.

3. යක්ෂයාගේ බලය නිරර්ථක කිරීමයි.
4. දෙවියන් වහන්සේගේ මහිමය පෙන්වා දීමයි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(01)

i. නව ගිවිසුමේ වෙනත් හසුන් හඳුන්වන නම් දෙකක් ලියන්න.
ii. INRI හි සිංහල අර්ථය ලියන්න.
iii. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග දෙකක් ලියා දක්වන්න.
iv. ශු.සතිය ආරම්භ හා අවසන් දින දෙක ලියා දක්වන්න.
v. පූදසුන සූදානම් කිරීම් පිළිවෙතට අයත් අනු කොටස් දෙක නම් කරන්න.
vi. මාක් ශුභාරංචියේ පරමාර්ථය ලියා දක්වන්න.
vii. ස්නාවක ජුවාම්තුමාගේ මව හා පියා නම් කරන්න.
viii. විවාහයේ පරමාර්ථ දෙකක් ලියන්න.
ix. ජන වන්දනා වර්ෂයට අයත් සති ගණන ලියා දක්වන්න.
x. කිතුනු සභාව පිළිගත් සභා දෙකක් ලියන්න. $(2\times 10 = 20)$

(02)

i. දෙවන දේව පණත නම් කරන්න. (ල.2)
ii. පඬුරු පිදීමේ පරමාර්ථ තුන ලියා දක්වන්න. (ල.3)
iii. ශු.බයිබලය අධ්‍යයනය කිරීමෙන් ඔබ ලබන ප්‍රයෝජන පහක් ලියා පහදන්න.(ල.5)

(2+3+5= 10)

(03)

i. ශු.මතෙව් ශුභාංරචිය සඳහා භාවිත වන වෙනත් නම් දෙකක් ලියන්න. (ල.2)
ii. ශු.බයිබලය් සඳහන් පරිදි දෙවියන් වහන්සේ නෝවාව තෝරා ගැනීමට හේතු වූ කරුණු තුනක් ලියන්න. (ල.3)
iii. දේව රාජ්‍ය ගොඩනැංවීම සඳහා තම වටිනා ජීවිතය දෙවියන්ට කැපකළ ධර්මදූතයන් සඳහා යාච්ඤාවක් නිර්මාණය කරන්න. (ල.5)

(2+3+5= 10)

(04)

i. පේදුරු තුමාගේ ප්‍රථම දේශනයේ අඩංගු කරුණු 02 ක් ලියන්න. (ල.2)
ii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ඔබගේ නමස්කාරය හා ගෞරවය පුදකළ හැකි ආකාර 03 ක් ලියන්න. (ල.3)
iii. ''දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම්'' යන මාතෘකාව යටතේ වචන 75 කට නොඅඩු පුවත්පතකට ලිපියක් ලියන්න. (ල.5)

(2+3+5=10)

(05)

i. දේව වාක්‍ය පිළිවෙත සඳහා ශු.ජොහාන් තුමාගේ ශුභාරංචිය භාවිතා කරනු ලබන ජන වන්දනා වසරේ කාල පරිච්ඡේද දෙක නම් කරන්න. (ල.2)

ii. දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ තුනක් ලියන්න. (ල.3)

iii. ඊශ්‍රායෙල් ජනතාව නික්මයාම ගමන තුළ දිව්‍ය සංරක්ෂණය අත්දුටු අවස්ථා 05 ක් ලියන්න. (ල.5)

(2+3+5=10)

(06)

i. ශු.බයිබලයේ සංකේත භාවිතයෙන් ලියා ඇති කෘතීන් නම් කරන්න. (ල.2)

ii. ලන්දේසීන් විසින් කතෝලිකයින්ට එල්ල කළ පීඩා තුනක් ලියන්න. (ල.3)

iii. අභිවෘද්ධි ආලේපය ලැබීමෙන් පසු ඔබේ ජීවිතයේ ඇතිවිය යුතු වෙනස්කම් 05 ක් ලියන්න. (ල.5)

(2+3+5=10)

(07) මාතෘකා දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

i. පංච පුස්තකය

ii. ද්විතීය සම්මත ග්‍රන්ථ

iii. දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා

iv. ජුසේවාස් මුනිතුමා

(5+5=10)